සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර I විභාගය - 2026 ජනවාරි

(101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2026-01-24
පෙරවරු
[09.00 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

<u>A කොටස</u>

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

01 වන ප්‍රශ්නය

අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, ගිණුම්කරණ නිමැවුමක් වන්නේ කුමක් ද?

(1) ශේෂ පිරික්සුම. (2) ලෙජර් ගිණුමක්.

(3) ගැනුම් ජර්නලය. (4) ආදායම් ප්‍රකාශනය.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, මූලික සටහන් පොතක් **නොවන්නේ** කුමක් ද?

(1) ලෙජරය. (2) මුදල් ලැබීම් ජර්නලය.

(3) පොදු ජර්නලය. (4) දෛනික විකුණුම් පොත.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, ගිණුම්කරණ ශිල්පියෙකු විසින් අනුගමනය කරනු ලබන ආචාර ධර්ම සංග්‍රහයේ මූලධර්මයක් වන්නේ කුමක් ද?

(1) අවංකභාවය (Integrity).

(2) වෘත්තිමය නිපුණත්වය (Professional Competence).

(3) අරමුණුගත බව (Objectivity).

(4) ඉහත සඳහන් සියල්ලම.

1.4 පහත සඳහන් තොරතුරු, 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කේවලස්වාමි ව්‍යාපාරයක් වන **පෙරේරා ට්‍රේඩර්ස්** හි, පොත්වලින් උපුටා ගන්නා ලදී:

	රු.
2024 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය	1,800,000
2025 මාර්තු 31 දිනට මුළු වත්කම්	4,850,000
වර්ෂය තුළදී හඳුන්වා දුන් අමතර ප්‍රාග්ධනය	800,000
වර්ෂය තුළදී සිදුකළ ගැනිලි	450,000
2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය	1,250,000

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2025 මාර්තු 31 දිනට **පෙරේරා ට්‍රේඩර්ස්** හි වගකීම් වූයේ:

(1) රු.3,050,000/-. (2) රු.1,450,000/-.

(3) රු.3,450,000/-. (4) රු.1,350,000/-.

1.5 කේවලස්වාමි ව්‍යාපාරයක, ගිණුම්කරණ සමීකරණයට ගනුදෙනුවකින් ඇති වන බලපෑම පහත සඳහන් පරිදි ඔබ වෙත ලබා දී ඇත:

(රු.)

වත්කම්			=	ස්කන්ධය	+	වගකීම්
තොගය	+	වෙළෙඳ ලැබිය යුතු මුදල්				
- 65,000		+ 90,000		+25,000		-

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, ඉහත ගිණුම්කරණ සමීකරණය සඳහා වඩාත්ම සුදුසු ගනුදෙනුව, පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) පිරිවැය රු.65,000/- ක් වූ භාණ්ඩ, රු.90,000/- ක මුදලට විකුණන ලදී.

(2) හිමිකරු විසින් රු.65,000/- ක් වටිනා භාණ්ඩ, ඔහුගේ පෞද්ගලික භාවිතය සඳහා ලබාගෙන ඇති අතර, මෙම භාණ්ඩවල පිරිවැය රු.90,000/- කි.

(3) පිරිවැය රු.65,000/- ක් වූ භාණ්ඩ, රු.90,000/- කට ණයට විකුණන ලදී.

(4) පිරිවැය රු.25,000/- ක් වූ භාණ්ඩ, රු.90,000/- කට අත්පිට මුදලට විකුණන ලදී.

1.6 තම ආයෝජනවල සුරක්ෂිතතාව සහතික කරමින් සමාගමේ ලාභදායීත්වය සහ ස්ථාවරත්වය කෙරෙහි මූලිකව උනන්දුවක් දක්වන්නේ පහත දැක්වෙන ඇල්මැති පාර්ශවයන්ගෙන් කවුරුන් ද?

(1) කොටස්හිමියන්. (2) පාරිභෝගිකයින්.

(3) සේවකයින්. (4) තරඟකරුවන්.

1.7 **ජෙෆ්රි,** මුදලින් රු.500,000/- ක් සහ රු.800,000/- ක් වටිනා මෝටර් රථයක් යොදවමින් ව්‍යාපාරයක් (කේවලස්වාමි ව්‍යාපාරයක්) ආරම්භ කරන ලදී. මෙම ගනුදෙනුව, ඔහුගේ ව්‍යාපාරයේ ලෙජර් ගිණුම්වල සටහන් කරනු ලබන නිවැරදි ක්‍රමය වනුයේ:

(1) ප්‍රාග්ධන ගිණුම හර රු.1,300,000/-, මෝටර් රථ ගිණුම බැර රු.800,000/- සහ මුදල් ගිණුම බැර රු.500,000/-.

(2) මුදල් ගිණුම හර රු.500,000/-, මෝටර් රථ ගිණුම හර රු.800,000/- සහ ප්‍රාග්ධන ගිණුම බැර රු.1,300,000/-.

(3) මුදල් ගිණුම හර රු.500,000/-, මෝටර් රථ ගිණුම හර රු.800,000/- සහ ගැතිලි ගිණුම බැර රු.1,300,000/-.

(4) මුදල් ගිණුම හර රු.500,000/-, ප්‍රාග්ධන ගිණුම හර රු.800,000/- සහ මෝටර් රථ ගිණුම බැර රු.1,300,000/-.

1.8 මුදල් ලැබීම් නොසලකා යම් නිශ්චිත ගිණුම්කරණ කාලපරිච්ඡේදයක් තුළ අයභාරය (ආදායම්) හඳුනා ගනු ලැබේ. මේ සම්බන්ධයෙන් සලකනු ලබන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) ගැලපුම් සංකල්පයයි.
(2) අස්තිත්ව (Entity) සංකල්පයයි.
(3) උපචිත සංකල්පයයි.
(4) මූල්‍ය මිණුම් සංකල්පයයි.

1.9 2025 දෙසැම්බර් 31 දිනට, **රමේෂ් ට්‍රේඩර්ස්** හි මුදල් පාලන ගිණුමේ හර (වාසිදායක) ශේෂය රු.475,000/- ක් වූ අතර, මෙම ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂයෙන් වෙනස් විය. 2025 දෙසැම්බර් 31 දිනට, ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් සහ උපලබ්ධි නොවූ චෙක්පත් පිළිවෙලින් රු.45,000/- ක් සහ රු.65,000/- ක් විය. තවද, බැංකුව විසින් රු.1,000/ ක් බැංකු ගාස්තු ලෙස අයකරගෙන ඇති අතර, මෙය මුදල් පාලන ගිණුමේ සලකා බලා නොමැත.

ඉහත තොරතුරු මත පදනම්ව, 2025 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනයේ සඳහන් වූ ශේෂය වූයේ:

(1) රු.454,000/-. (2) රු.494,000/-. (3) රු.365,000/-. (4) රු.495,000/-.

1.10 ව්‍යාපාරයේ හිමිකරුගේ විදුලි බිල්පතක් ව්‍යාපාරය විසින් ගෙවන ලද අතර, එය ව්‍යාපාරයේ ගැතිලි ලෙස සලකන ලදී. ඉහත සැලකීමට අදාල වන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) උපචිත සංකල්පයයි.
(2) ගැලපුම් සංකල්පයයි.
(3) අස්තිත්ව සංකල්පයයි.
(4) ආරක්ෂණ සංකල්පයයි.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 විශ්වාසදායී නියෝජනය (Faithful representation) යනු මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ලක්ෂණයකි.

1.12 බැංකු සැසඳුම් ප්‍රකාශනයන් පිළියෙල කිරීමේදී, ව්‍යාපාරයේ සියලුම වැරදි සහ වංචා අනාවරණය කරගත හැකිය.

1.13 විකුණුම් ගිණුම, නාමික ගිණුමක් සඳහා උදාහරණයකි.

1.14 ක්වික් බුක් [Quick Book (QB)] ගිණුම්කරණ පැකේජය, විශේෂිත වූ ගිණුම්කරණ පැකේජයක් ලෙස වර්ගීකරණය කළ හැකිය.

1.15 ආරක්ෂණ සංකල්පයට අනුව, තොග අගය කරනු ලබන්නේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් [Net Realizable Value (NRV)] අඩු අගයට වේ.

අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.

1.16 "වත්කමක්" යන පදය නිර්වචනය කරන්න.

1.17 පොදු ජර්නලයේ සටහන් කරනු ලබන ගනුදෙනු වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

1.18 "අඛණ්ඩ පැවැත්ම සංකල්පය" කෙටියෙන් පැහැදිලි කරන්න.

1.19 ආදායම් ප්‍රකාශනයේ මූලිකාංග දෙක(02) සඳහන් කරන්න.

1.20 **මාලා ට්‍රේඩර්ස්හි** පහත සඳහන් එක් එක් ගනුදෙනු වාර්තා කිරීම සඳහා භාවිත කරනු ලබන අදාල මූලාශ්‍ර ලියවිල්ල හඳුනා දක්වන්න:

(a) කාර්යාලයේ භාවිතය සඳහා රු.250,000/- ක් වටිනා පරිගණකයක්, ණයට මිලදී ගැනීම.

(b) ගනුදෙනුකරුවෙකුට රු.100,000/- ක් වටිනා භාණ්ඩ අත්පිට මුදලට විකිණීම.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

A කොටසෙහි අවසානය

B කොටස

(මුළු ලකුණු 40)

02 වන ප්‍රශ්නය

CAT ඉංජිනියරින් යනු විවිධ ආකාරයේ යකඩ නිෂ්පාදිත නිෂ්පාදකයෙකු වන අතර, පහත සඳහන් තොරතුරු 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **CAT ඉංජිනියරින්** හි ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදී:

විස්තරය	රු.
2024 අප්‍රේල් 01 දිනට අමුද්‍රව්‍ය තොගය	180,000
වර්ෂය තුළදී මිලට ගත් අමුද්‍රව්‍ය	7,750,000
අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුළී	230,000
2024 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ)	190,000
සෘජු වේතන	2,400,000
කර්මාන්තශාලා රක්ෂණය	240,000
විදුලිය	350,000
කර්මාන්තශාලා කළමනාකරුගේ වැටුප	660,000
කර්මාන්තශාලාවේ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ වියදම්	130,000
කුලිය	900,000
ක්ෂය - පිරියත සහ යන්ත්‍ර	400,000
ක්ෂය - මොටර් ලොරි රථය	500,000

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනට පැවති අවසන් තොග ශේෂයන්, පහත පරිදි අගය කර ඇත:

විස්තරය	පිරිවැය (රු.)
අමුද්‍රව්‍ය තොගය (පිරිවැයට)	520,000
නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කර ඇත)	260,000

(2) පහත සඳහන් වියදම්, පහත පරිදි බෙදා වෙන්කළ යුතුය:

වියදම්	කර්මාන්තශාලාව	කාර්යාලය
විදුලිය	90%	10%
කුලිය	65%	35%

(3) පිරියත සහ යන්ත්‍ර, කර්මාන්තශාලාවේ කටයුතු සඳහා භාවිත කරන අතර, නිමකරන ලද භාණ්ඩ ගනුදෙනුකරුවන් වෙත බෙදා හැරීම සඳහා මෝටර් ලොරි රථය භාවිත කරනු ලබයි.

(4) නිෂ්පාදිත භාණ්ඩ, නිෂ්පාදන පිරිවැය මත 20% ක ලාභයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

ඔබ විසින් කළ යුතු දෑ:

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, **CAT ඉංජිනියරින්** හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) **පිළියෙල කරන්න.** (ලකුණු 10)

03 වන ප්‍රශ්නය

ෂර්මා කැෆේ, 2025 ජනවාරි 01 දින **ෂර්මා** විසින් ආරම්භ කරන ලද කෝපි සැලකි (coffee shop).

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) සාරාංශය පහත දැක්වේ:

මුදල් පාලන ගිණුම (මුදල් පොත)

ලැබීම්	හර (රු.)	ගෙවීම්	බැර (රු.)
මූලික ප්‍රාග්ධන ආයෝජනය	2,000,000	අත්පිට ගැනුම්	1,250,000
වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම්	2,500,000	වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම්	3,500,000
අත්පිට විකුණුම්	4,000,000	ස්ථාවර තැන්පතුව	800,000
		ස්වයංක්‍රිය කෝපි යන්ත්‍රයක් මිලට ගැනීම (2025 අප්‍රේල් 01 දින මිලට ගන්නා ලදී)	600,000
		සුළු මුදල් පොතට මාරු කළ මුදල	80,000
		වැටුප් සහ වේතන	500,000
		ප්‍රචාරණ වියදම්	200,000
		ආරක්ෂක වියදම්	400,000
		ගෙවූ විදුලි සහ ජල බිල්පත්	300,000
		ගෙවූ කුලිය	440,000
		ප/ගෙ ශේෂය	430,000
	8,500,000		**8,500,000**
ඉ/ගෙ ශේෂය	430,000		

(2) 2025 දෙසැම්බර් 31 දිනට, ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ පහත සඳහන් පරිදි වේ:

	රු.
වෙළෙඳ ණයගැතියෝ	1,400,000
වෙළෙඳ ණයහිමියෝ	2,600,000
ගෙවිය යුතු විදුලි සහ ජල බිල්පත්	25,000

(3) කෝපි යන්ත්‍රය, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතුය.

(4) පහත සඳහන් වියදම්, සුළු මුදල් මගින් ගෙවා ඇත:

- ගමන් වියදම් : රු.25,000/-.
- අනියම් වේතන : රු.35,000/-.
- කාර්යාල වියදම් : රු.5,000/-.

(5) 2025 දෙසැම්බර් මාසය සඳහා කුලිය රු.40,000/- ක් වූ අතර, එය 2026 ජනවාරි මාසයේදී ගෙවිය යුතුය.

(6) 2025 ඔක්තෝම්බර් 01 දින, 8% බැගින් වූ වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ මාස 3 ක ස්ථාවර තැන්පතුවක් විවෘත කරන ලදී. 2026 ජනවාරි 01 දින, බැංකුව පළමු මාස 3 සඳහා පොලිය ගෙවා ඇත.

(7) 2025 දෙසැම්බර් 31 දිනට, තොග කිසිවක් නොතිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

2025 දෙසැම්බර් 31 දිනට, **ෂර්මා කැෆේ** හි ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

04 වන ප්‍රශ්නය

සුරේන් හාඩ්වෙයාර්, සුරේන් ට අයිතිව ඇති කේවලස්වාමි ව්‍යාපාරයකි. **සුරේන් හාඩ්වෙයාර්** හි ගිණුම් විධායක විසින් 2025 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ බැර පැත්තේ රු.26,300/- ක වෙනසක් පෙන්වූ අතර, එය අවිනිශ්චිත ගිණුමට බැර කොට කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී. **සුරේන් හාඩ්වෙයාර්** විසින් වෙළෙඳ ලැබිය යුතු මුදල් සහ වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා පාලන ගිණුම් පවත්වා නොගනී.

වෙනස සඳහා පහත සඳහන් හේතු පසුව හඳුනාගන්නා ලදී:

(1) 2025 මාර්තු 01 දින, **සීමාසහිත ABC සමාගමෙන්** රු.450,000/- කට කාර්යාලයේ භාවිතය සඳහා මිලට ගත් පරිගණකයක්, ගැනුම් ගිණුමට හර කොට ඇත. නමුත් මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇත. පරිගණක, පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර, වර්ෂයට අදාළ ක්ෂය කිරීම, ගිණුම් පොත්වල වාර්තා කර නොමැත.

(2) **සම්පත්** නම් ණයගැතියෙකුගෙන් ලද රු.12,000/- ක මුදල, මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇති නමුත්, එය අදාළ වෙළෙඳ ණයගැතියාගේ ගිණුම වෙනුවට, විකුණුම් ගිණුමට බැර කොට ඇත.

(3) 2025 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු රු.3,500/- ක විදුලි බිල්පතක්, උපචිත වියදම් ගිණුමේ පමණක් සටහන් කර ඇත.

(4) රු.8,000/- ක අත්පිට විකිණීමක්, මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.

(5) රු.25,000/- ක කුලී වියදමක්, රු.52,000/- ක් ලෙස කුලී වියදම් ගිණුමේ සටහන් කර ඇත. නමුත්, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇත.

(6) **සුරේන්,** ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා රු.5,200/- ක මුදලක් ලබාගෙන තිබූ අතර, එය මුදල් පොතේ පමණක් සටහන් කර තිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ඉහත සඳහන් වැරදි, නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(b) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

05 වන ප්‍රශ්නය

(A) **ඇන්ඩෲ** විසින් සෙල්ලම් බඩු සාප්පුවක් පවත්වාගෙන යන අතර, 2025 අගෝස්තු මාසය තුළ පහත සඳහන් ගනුදෙනු සිදුවී ඇත:

(1) **ඇන්ඩෲ** විසින් රු.6,000,000/- ක මුදලක්, මූලික ප්‍රාග්ධනය ලෙස යොදවමින් ව්‍යාපාරය ආරම්භ කරන ලදී.

(2) **සීමාසහිත ABC සමාගමෙන්** රු.1,000,000/- කට කාර්යාල උපකරණ, ණයට මිලදී ගන්නා ලදී.

(3) මුදලින් රු.1,700,000/- ක් ගෙවා, රු.3,500,000/- ක් වටිනා භාණ්ඩ මිලට ගත්තේය. ඉතිරි මුදල ණය පදනම මත විය.

(4) පිරිවැය රු.2,500,000/- ක් වූ භාණ්ඩ, රු.3,500,000/- කට **XYZ ට්‍රේඩර්ස්** වෙත ණයට විකුණන ලදී.

(5) රු.800,000/- ක වැටුප් ගෙවන ලදී.

(6) **ඇන්ඩෲ,** ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා රු.100,000/- ක මුදලක් ලබාගන්නා ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මඟින්, පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සඳහන් කරන්න.**

[කාර්යාල උපකරණ + තොගය + ණයගැතියන් + මුදල් = ස්කන්ධය (ප්‍රාග්ධනය) + වගකීම්] (ලකුණු 06)

(B) 2025 දෙසැම්බර් 31 දිනට, **XYZ ට්‍රේඩර්ස්** හි බැංකු ප්‍රකාශනයේ රු.29,000/- ක වාසිදායක ශේෂයක් පෙන්වූ අතර, එදිනට මුදල් පාලන ගිණුමේ රු.48,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්විය.

පසුව, **XYZ ට්‍රේඩර්ස්** හි ගිණුම් විධායක විසින් බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පාලන ගිණුමේ ශේෂය අතර, වෙනසට පහත සඳහන් හේතු සටහන් කරගන්නා ලදී:

(1) සැපයුම්කරුවෙකුට නිකුත් කළ රු.10,000/- චෙක්පතක්, 2025 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි.

(2) 2025 දෙසැම්බර් 20 දින ගනුදෙනුකරුවෙකු විසින් රු.18,000/- ක මුදලක්, බැංකු ගිණුමට සෘජුවම තැන්පත් කර ඇති නමුත් මේ පිළිබඳව මුදල් පොතේ සටහන් කර නොමැත.

(3) 2025 දෙසැම්බර් 30 දින, බැංකුව විසින් බැංකු ගාස්තු ලෙස රු.1,500/- ක් හර කර තිබෙන අතර, එය මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

(4) ණයගැතියෙකුගෙන් ලැබුණු රු.8,000/- ක චෙක්පතක්, බැංකුවේ තැන්පත් කර ඇත. නමුත්, 2025 දෙසැම්බර් 31 දින වන විටත් එය උපලබ්ධි වී නොතිබුණි.

(5) ස්ථාවර තැන්පතුවක් මත ලද රු.2,500/- ක පොලිය, බැංකුව විසින් බැංකු ගිණුමට බැර කර තිබූ නමුත් එය මුදල් පොතේ සටහන් කර නොමැත.

(6) බැංකුවට ලබා දී ඇති ස්ථාවර නියෝගය අනුව, බැංකුව විසින් රු.40,000/- ක ණය වාරිකයක් හර කර තිබේ. කෙසේවුවද, මෙය මුදල් පොතේ සටහන් කර නොමැත.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ **පිළියෙළ කරන්න**:

(a) ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 02)

(b) 2025 දෙසැම්බර් 31 දිනට, බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

C කොටස
(මුළු ලකුණු 20)

06 වන ප්‍රශ්නය

විස්කම් ට්‍රේඩර්ස්, විශ්ව ට අයිතිව ඇති කේවලස්වාමි ව්‍යාපාරයක් වන අතර, 2025 මාර්තු 31 දිනට **විස්කම් ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

විස්කම් ට්‍රේඩර්ස්

2025 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම *(රු.'000)*

විස්තරය	හර	බැර
දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට:		
ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ වටිනාකම - රු.3,000,000/-)	6,000	
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	5,000	
මෝටර් වාහන	4,000	
කාර්යාල උපකරණ	1,000	
2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:		
ගොඩනැගිල්ල		2,400
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්		2,500
මෝටර් වාහන		2,000
කාර්යාල උපකරණ		250
විකුණුම්		140,000
ගැනුම්	72,000	
2024 අප්‍රේල් 01 දිනට තොගය	12,000	
අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල්	380	
වෙළෙඳ ලැබිය යුතු මුදල්	32,000	
වෙළෙඳ ගෙවිය යුතු මුදල්		7,000
බැංකු ණය මුදල		4,000
වැටුප් සහ වේතන	16,100	
දුරකතන ගාස්තු	800	
ගෙවන ලද ගබඩා කුළිය	6,000	
විකුණුම් කොමිස්	3,000	
රක්ෂණ වියදම්	220	
විදුලි වියදම්	1,500	
කාර්යාල වියදම්	1,350	
ආරක්ෂක ගාස්තු	600	
ගමන් සහ ප්‍රවාහන වියදම්	1,400	
2024 අප්‍රේල් 01 දිනට, ප්‍රාග්ධන ගිණුම		5,200
එකතුව	**163,350**	**163,350**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනට අවසාන තොගය රු.6,500,000/- ක පිරිවැයකට අගය කරන ලදී.

(2) 2025 ජනවාරි 01 දින, ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා රු.4,000,000/- ක බැංකු ණයක්, 10% ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ ලබාගෙන ඇත. මෙම ණය මුදල, 2025 අප්‍රේල් 01 දින සිට මාස 12 ක් තුළ සම්පූර්ණයෙන්ම ගෙවා නිම කිරීමට එකඟ වී ඇත. 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාල ගෙවිය යුතු ණය පොලිය, ගිණුම් පොත්වල වාර්තා කර නොමැත.

(3) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත සඳහන් පරිදි පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

ගොඩනැගිල්ල	:	වර්ෂයකට 10% බැගින්
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	:	වර්ෂයකට 20% බැගින්
මෝටර් වාහන	:	වර්ෂයකට 25% බැගින්
කාර්යාල උපකරණ	:	වර්ෂයකට 25% බැගින්

(4) ව්‍යාපාරයේ විකුණුම් කණ්ඩායම සඳහා විකුණුම් මත 5% ක විකුණුම් කොමිස් ගෙවනු ලැබේ. 2025 මාර්තු 31 දිනෙන් වූ අවසන් වූ වර්ෂය තුළදී රු.3,000,000/- ක් ගෙවා ඇති අතර, ඉතිරි මුදල 2025 අප්‍රේල් මාසයේදී ගෙවා ඇත.

(5) "ගෙවන ලද ගබඩා කුලිය" තුළ 2025 අප්‍රේල් සිට 2025 ජූනි දක්වා කාලයට අදාල රු.1,200,000/- ක් ඇතුලත් වේ.

(6) රු.2,000,000/- ක ණයගැතියෙකු බොල් ණය ලෙස ලියා හැරීමටත්, 2025 මාර්තු 31 දිනට, ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 5% ක අඩමාණ ණය ප්‍රතිපාදනයක් සිදුකිරීමටත් **විශ්ව** තීරණය කළේය.

ඔබ විසින් කල යුතු දෑ:

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

C කොටසෙහි අවසානය

කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
දැනුම (1)	තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම	අදින්න	හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම.
		සම්බන්ධ කරන්න	තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම.
		සඳහන් කරන්න	ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම.
		හඳුනා දක්වන්න	සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම.
		ලැයිස්තුගත කරන්න	විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
අවබෝධය (2)	අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම.	හඳුනාගන්න	අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම.
		අර්ථකතනය කරන්න	වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න.
		විස්තර කරන්න	ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න.
		පැහැදිලි කරන්න	අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම.
		නිර්වචනය කරන්න	ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
භාවිතය (3)	අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම.	සසඳන්න	තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න.
		ප්‍රස්තාර දක්වන්න	ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න.
		තක්සේරු කරන්න	වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න.
		විසඳන්න	ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම.
		පිළියෙල කරන්න	විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම.
		ප්‍රදර්ශනය කරන්න	උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම.
		ගණනය කරන්න	ගණිතමය ගණනය කිරීම මගින් සොයා ඇතගැනීම හෝ ගණන් ගැනීම.
		භාවිත කරන්න	ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
විශ්ලේෂණය (4)	අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම.	සන්නිවේදනය කරන්න	තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම.
		සැකිල්ලක් සේ දක්වන්න	සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.
		අසමානතා බලන්න	අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම.
		සමානකම් බලන්න	සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම.
		විමසන්න	තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම.
		වෙනස්කොට දක්වන්න	යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම.
		විශ්ලේෂණය කරන්න	විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න.